# එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක්

ස්වීඩනයේ ස්ටොක්හෝම් නගරයේදී පැවැත්වුණු මානව පරිසරය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුවෙන් පසු සහ පරිසරය විනාශ මුඛයට යාමේ වේගය අධික වෙමින් තිබෙන විට, 1972 දී විශාල කාර්‍යභාරයක් එනම් - ගෝලීය පාරිසරික ගැටහළු එළිදරව් කිරීම, ජාත්‍යන්තර සහයෝගීතාව වර්ධනය කිරීම, පාරිසරික වශයෙන් යහපත් වූ ද ප්‍රවර්තනීය වූ ද සංවර්ධනය සඳහා අවශ්‍ය අංගෝපාංග සම්පාදනය කිරීම සහ අර්ථවත් ක්‍රියාමාගී ශක්තිමත් කිරීම යන මේවා - පැවරුණු එක්සත් ජාතීන්ගේ නව සංවිධානයක් බිහි කිරීමට ආණ්ඩු විසින් තීරණය කරන ලදී.

එකී සංවිධානය නම් එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන (එ.ජ.ප.වැ) වන අතර එහි විසි වැනි සංවත්සරය සැමරෙන්නේ මේ වර්ෂයේදී ය. එක්සත් ජාතීන්ගේ වෙනත් ආයතන මෙන් නොව, කෙන්යාවේ නයිරෝබි නුවර මූලස්ථානය කොටගත් එක්සත් ජාතීන්ගේ පරිසර වඩසටහන 1970 දශකයේ මුල් භාගයේදී එක්සත් ජාතීන්ගේ ක්‍රමය හා සම්බන්ධිත නව මූලාරම්භයක් විය. එය දළ වශයෙන් 200 දෙනෙකුගෙන් පමණ සමන්විත විශ්ව ව්‍යාප්ත වෘත්තීය කාර්යමණ්ඩලයකින් සැදුම්ලත් කුඩා සංවිධානයක් වන අතර වර්ෂ ගණනාවක් තිස්සේ එහි අයවැය ඇඩො. දසලක්ෂ 50 ක් ව පැවතිණි. මේ මුදල ලෝකය යුධ අවි සඳහා සෑම විනාඩි 40 කදී වැය කරන මුදලටත් අඩු මුදල් ප්‍රමාණයකි. පරිසරයට මෙන්ම කෘෂිකර්මය, වනවගාව, පතල් කැණීම, බලශක්තිය, කර්මාන්ත, වායුගෝල, ආර්ථික කටයුතු සහ වෙළඳාම, රාජ්‍ය මුදල් සහ ස්වාභාවික පරිසරය හා සමග ප්‍රතික්‍රියා කරන වෙනත් දහසකුත් එකක් සාධක ද හා සම්බන්ධ වන සේ පාරිසරික කළමනාකරණය සඳහා බහුවිධ ප්‍රවේශයක් ගොඩනැගීමේ කාර්යභාරය ද මීට පැවරිණි.

එය සතුව ඇති විශාල බලතල ප්‍රමාණය සහ කුඩා සම්පත් ප්‍රමාණය අතර පැහැදිළි ව පෙනීයන පරතරයක් පවතින නමුදු, යෝග්‍ය ව්‍යාපෘතීන් සාර්ථක ලෙස ආරම්භකිරීම මගින් සම්පත් වැඩිපුර ඇති අන්‍යයන් වැඩ කටයුතු වල නිරත කරවාගෙන ඉතික්බිතිව අන්‍යයන් එනම්- ආණ්ඩු, ජාත්‍යන්තර සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන යන මේවා- අඛණ්ඩ මූල්‍ය ආධාර සහ වෙනත් ආධාර ලබාදීමෙහි ලා පොළඹවාලීම සඳහා එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන තමන්ට සපයනු ලැබ ඇති සියළු ද ප්‍රයෝජනයට ගෙන ඇත. එ.ජා.ප.වැ. සතු උත්ප්‍රේරක බලතල එක් සංඛ්‍යාතී ය කින් පිළිබිඹු වේ. එනම්, එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන විසින් වැය කරනු ලබන එක් එක් ඇමරිකානු ඩොලර් දස ලක්ෂයක් වෙනුවෙන් වෙනත් ප්‍රතිපූරක ප්‍රභවයන් කෙරෙන් තවත් ඇමරිකානු ඩොලර් දශ ලක්ෂ 4 ක් සොයාගනු ලැබ ඇත.

හැකි සෑම අවස්ථාවකදී ම, එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන එ.ජා. වෙනත් සංවිධාන ද රාජ්‍ය නො වන සංවිධාන ද රාජ්‍ය ද සමග කටයුතු කරයි. නිදසුන් වශයෙන්, ළමයින් සහ පරිසරය පිළිබඳ කටයුතුවල දී "යුනිසෙෆ්" ආයතනය සමග ද පරිසරය හා සෞඛ්‍යය පිළිබඳ කටයුතුවලදී ලෝක සෞඛ්‍ය සංවිධානය සමග ද දේශගුණික විපර්යාස පිළිබඳ කටයුතුවලදී ලෝක කාලගුණවිද්‍යා සංවිධානය සමග ද ආදි වශයෙනි. එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහනේ ප්‍රතිපත්තිය සමස්ත වශයෙන් පාලනය වන්නේ එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් තෝරා පත් කරනු ලබන 58 දෙනෙකුගෙන් සමන්විත පාලක මණ්ඩලය විසිනි. මේ මණ්ඩලය වර්ෂ දෙකකට වරක් රැස්වේ.

**කලාපීය සහයෝගීතාව ගොඩනැගීම**

එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන 1972 දී ක්‍රියාරම්භ කරන විට, පාරිසරික ප්‍රශ්න ජාතීන්ගේ දේශ සීමාවන් ඉක්මවා යතැයි යන තර්කය ඉදිරිපත් කිරීමෙහි ලා තියුණු අරගලයකට මුහුණදීමට ඊට සිදු විය. පැහැදිළි ලෙස දැනට දක්නා ලැබෙන එමෙන් ම රටවල් අතර සම්බන්ධිකෘත සහයෝගී ක්‍රියාමාර්ග අවශ්‍ය කෙනෙ අප හමුවේ ඇතිප්‍රශ්න වලින් කීපයක් වන දේශ සීමාවන්ගෙන් ඔබ්බට සිදුවන වායු සහ ජල දූෂණය, ඕසෝන් ස්තරය පිරිහීයාම, විෂරසායන ද්‍රව්‍ය සහ අනර්ථකාරී අපද්‍රව්‍ය ප්‍රමාණය ශීඝ්‍රයෙන් වැඩිවීම සහ ඒවායේ ජාත්‍යන්තර වෙළඳාම, කාලගුණික විපර්යාස සහ ගෝලීය රත්වීම යන මේවා අත්හද නොබැලූ නව රටාවන්ය.

ගෝලීය ගැටළු ප්‍රමාණය එන්ට එන්ටම වැඩිවන විට දී, මධ්‍යධරණී මුහුදේ සිට කලාපීය මට්ටමෙන් කටයුතු ඇරඹීමට එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන විසින් තීරණය කරන ලදී. හැත්තෑ ගණන්වලමුල්භාගයේ දී පළිබෝධ නාශක, රසායනික පොහොර, කැළි-කසළ, තෙල්, කාර්මික රසායන ද්‍රව්‍ය සහ අනර්ථකාරී අපද්‍රව්‍ය ඇතුළු ප්‍රතිකර්ම නො යෙදූ ජලාපවහන මුහුදට ගලා ඒමේදී, ශත වර්ෂ 40 කට අධික ශිෂ්ටාචාරයකට හිමිකම් කියන මධ්‍යධරණී ප්‍රදේශ අභාවයට යතැයි බොහෝ දෙනා බිය වූහ. එක් තනි රටක ඒකපාර්ශ්වීය ක්‍රියාමාර්ග තුළින් සුළු ප්‍රගතියක් ලබා ගත හැකි විය. දූෂණ අඩු කිරීමේ රෙගුලාසි වඩාත් දැඩි ලෙස ක්‍රියාත්මක කිරීම තුළින් දේශ සීමා ඉක්මවා යන දූෂණයන්ගෙන් ආරක්ෂා වීමට කිසිවකුටත් නො හැකි විය.

එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන විසින් 1975 දී රටවල් 18 ක් සාකච්ඡා මේසයකට කැඳවා ගනු ලැබූ අතර, සිය මුහුදු පරිසරය පිළිබඳ ඔවුන් දක්වූ ප්‍රවේදිතාව හේතු කොට ගෙන ක්ෂණික ව වෙනස් වන එකකැයි නො පෙනුණු ඊශ්‍රායලය සහ සිරියාවත් තුර්කිය සහ ග්‍රීසියත් අතර නොරිස්සුම් ගතිය මැඩ පවත්වා ගත හැකි විය. පර්යේෂණ, පරිසර, අධීක්ෂණය, දූෂණ පාලනය වෙරළාශ්‍රිත සහ මුහුදු සම්පත් රැක ගැනීම හා පරීක්ෂාකාරී ව සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් සහයෝගීතාව ගොඩ නැගීම සැලසුමේ මුඛ්‍යාර්ථය වේ. තෙල් පිටාර ගැලීම, කසල දැමීම, පාරිසරික අනතුරු සහ ගොඩබිම් දූෂණය, ප්‍රභවයන්ගෙන් ඇති වන අනුවර්තන බඳු මධ්‍යධරණී ප්‍රදේශය කෙරෙහි බලපාන නිශ්චිත ප්‍රශ්නවලට අදාළව නීතිමය බැඳීමකින් යුත් ජාත්‍යන්තර සම්මුති මේ සැලසුම මගින් ඇති කරන ලදී.

මධ්‍යධරණී කාර්ය සැලැස්ම, ජාත්‍යන්තර පරිසර සහයෝගීතාව පිළිබඳ ප්‍රධාන ප්‍රගතියක් ද එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහනට අයත් කලාපීය මුහුදු වැඩසටහන් දහයේ පදනමට මුල් වූ පසුකාලීන ක්‍රියාරම්භයන් පිළිබඳ මූලික සැලැස්ම ද විය. මධ්‍යධරණී ප්‍රදේශය, ක්වේට් කලාපය, රතු මුහුද, මහා කැරිබියන් ප්‍රදේශය, බටහිර සහ මධ්‍යම අප්‍රිකාවේ අත්ලන්තික් වෙරළ, නැගෙනහිර අප්‍රිකානු මුහුදු මණ්ඩලය, දකුණු ඇමරිකානු ශාන්තිකර වෙරළ, දකුණු ශාන්තිකර දිවයින්, නැගෙනහිර ආසියානු කලාපය සහ දකුණු ආසියානු මුහුදු ද ඇතුළත් වන සේ දැනට රටවල් 120 කට අධික සංඛ්‍යාවක් මෙකී සැලැසුම්වලට සහභාගී වෙති.

මුහුදු වැඩසටහනට අතිරේකව, අපගේ ග්‍රහ ලෝකයට අයත් ජාත්‍යන්තර වශයෙන් හවුලේ ප්‍රයෝජනයට ගනු ලබන ගංගාවන් 200 ක් අතරින් සමහරක් ද විල් හා ජලාශ ද ආරක්ෂා කිරීම සඳහා කලාපීය සහයෝගිතාව වර්ධනය කර ගැනීමට ද එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන උදව් දී ඇත. ගොඩබිම් ජලය පාරිසරික වශයෙන් හානිකර නොවන සේ කළමනාකරණය කිරීම සඳහා වූ එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහනට, අධීක්ෂණ සහ තැක්සේරු කටයුතු, බොන වතුර සහ සනීපාරක්ෂාව ප්‍රමාණවත් ලෙස ලබාදීම, පස සහ වනවගා සංරක්ෂණය, දියබෙත්ම කළමනාකරණය, බලශක්ති ව්‍යාපෘති, වනජීවී සහ ජාන සංරක්ෂණය, ධීවර කර්මාන්තය, ජල තත්ත්ව පාලනය ද ඇතුළත් වේ. මේ ක්ෂේත්‍රය තුළට අයත් එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහනට සැම්බසි ගංගාධාරය ප්‍රයෝජනයට ගන්නා ඇංගෝලාව, නැමීබියාව, බොස්ට්වානාව, සැම්බියාව, සිම්බාබ්වේ, මලාවි, ටැන්සානියාව සහ මොසැම්බික් යන අප්‍රිකානු රටවල් අවේ සහාය ලැබී ඇත. චැඩ් විලේ ඉවුරු ප්‍රදේශය, ඇරල් මුහුද, නයිල් නදිය සහ ලතින් ඇමරිකාවේ ගංගා ඉවුරු ද සඳහා මීට සමාන සැලසුම් ක්‍රියාත්මක වෙමින් හෝ සැලසුම් කරනු ලබමින් පවතියි.

කලාපීය සහයෝගිතාව වර්ධනය කිරීම කොතෙක් අපහසු වුවද සාමූහික ක්‍රියාමාර්ග කෙළින්ම තම යහපතට හේතුවන බැව් අවබෝධ වෙනම් එක්ව ක්‍රියාකිරීමට රටවල් කැමති බව වාර්තාවන්ගෙන් පෙනී යේ. රටවලට කෙළින්ම පෙනෙන්නේ වායුව දූෂණය වීම හෝ මුහුදු අපිරිසිදු වීම නිසා ඇතිවන බලපෑමය. එතකුදු වුවත් මීට වඩා දුරවබෝධ කරුණ නම් ගෝලීය ප්‍රශ්න පිළිබඳව අවධානය යොමු කිරීම සඳහා සැබෑ සහයෝගීතාවක් ඇතිකරගැනීම පිණිස අවශ්‍ය හදිසි වුවමනාව සොයාගැනීමයි.

**මිහිතල නීති**

එහෙත්, පසුගිය අවුරුදු විස්සක කාලය තුළදී ජාත්‍යන්තර පාරිසරික නීති සම්බන්ධයෙන් සැහෙන ප්‍රගතියක් ලබා ඇත. දළ වශයෙන් බහු පාර්ශ්වීය පාරිසරික ගිවිසුම් 150 ක් පමණ ග්‍රන්ථගත වී ඇත. ඉන් තුනෙන් එක් කොටසක් පමණ එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන විසින් නියෝජිතායතනවලට පවරනු ලැබ ඇත. ජාත්‍යන්තර සාකච්ඡාවලදී, එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන විසින් ප්‍රධාන ගෝලීය ගිවිසුම් පහක් සාර්ථක ලෙස නිමකිරීමත් ක්‍රියාත්මක කිරීමත් සපුරාගැනීම සඳහා "අවංක තැරැව්කරු" කාර්ය භාරය ප්‍රයෝජනයට ගනු ලැබ ඇත. ඒවා මෙසේය.-

අනතුරට පත් වන සත්ත්ව සහ ශාක විශේෂවල ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ 1973 ප්‍රඥප්තිය (CITES), සංක්‍රමණික විශේෂයන් සංරක්ෂණය

කිරීම පිළිබඳ 1979 ප්‍රඥප්තිය (CMS), ඕසෝන් ස්තරයේ ආරක්ෂාව සඳහා වූ 1985 වියානා ප්‍රඥප්තිය, ගෝලීය පාරිසරික සහයෝගීතාව සඳහා වූ ප්‍රධාන ඉදිරිගමනක් වශයෙන් සහ අනාගත සියළු ජාත්‍යන්තර ක්‍රියාමාර්ග පිළිබඳ මූලික සැලැස්මක් වශයෙන්ද පැසසුමට ලක්වූ ඕසෝන් ස්ථරය පරිහානියට ලක්කරන ද්‍රව්‍ය පිළිබඳ 1987 මොන්ට්‍රියල් සම්මුතිය, ඕසෝන නාශක ද්‍රව්‍ය තහනම් කිරීම සඳහා වඩාත් දැඩි ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට පමණක් නොව ජාත්‍යන්තර ගිවිසුම් ඉතිහාසයේ ප්‍රථම වරට පාරිසරික වශයෙන් පිළිගත හැකි තාක්‍ෂණ ක්‍රම ලබා ගැනීමට සංවර්ධනය වන රටවලට අතිරේක මූල්‍ය සම්පත් ලබාදීමට ද රාජ්‍යයන් එකගවූ 1990 ජූනි මාසයේදී මොන්ට්‍රියල් සම්මුතියට සිදු කරන ලද සංශෝධන, සහ උපද්‍රවකාරී අපද්‍රව්‍ය දේශ සීමා හරහා ගෙන යාම සහ අපහරණය පිළිබඳ 1989 බැසල් ප්‍රඥප්තිය යන මේවාය. ඉහතකී බැසල් ප්‍රඥප්තිය (CITES) සහ (CMS) ප්‍රඥප්තිය පිළිබඳ ලේකම් කාර්යාලය ලෙසද, එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන ක්‍රියා කරයි.

**ඕසෝන් ස්ථරය රැකගැනීම; සවිස්තර කාර්ය සැලැස්මක්:**

ගෝලීය ඕසෝන් ස්ථරය හානි වී යාම බලාපොරොත්තු වූවාට වඩා දැඩි වී ඇති බවට නව විද්‍යාත්මක සාක්ෂි ඇති බැවින් මොන්ට්‍රියල් සම්මුතියට අයත් පාර්ශ්වයන්ගෙන් හතරවැනි රැස්වීම එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන විසින් 1992 දී පවත්වනු ලබනවා ඇත. ඕසෝන් ස්ථරය ආරක්ෂා කරගැනීම සඳහා තව දුරටත් ක්‍රියා කිරීමේ දැඩි අවශ්‍යතාව රාජ්‍යයන් විසින් පිළිගනු ලැබේ. සංවර්ධිත හා සංවර්ධනය වන සියළු රටවල් විසින් සම්මුතියට ඇතුලත් නීති රීති පිළිගනු ලබන බවට වගබලාගැනීම එක් වැදගත් අංගයක් වේ. හැකිතාක් පුළුල් සහභාගීත්වයක් සහතික කරනු වස්, තාක්‍ෂණ පැරවීමේ ගිවිසුම්වලදී දියුණු වන රටවලට සහාය වීම සඳහාත් සහයෝගී ජාත්‍යන්තර ක්‍රියාමාගී තර කිරීම උදෙසා දියුණු වන රටවලට සංක්ෂේප රාෂ්ඨීය තොරතුරු, ව්‍යවස්ථා සහවෙනත් තාක්‍ෂණික ක්‍රම ලබා දීම සඳහාත් තුන් අවුරුදු කාල සීමාවක් තුළදී ඩොලර් දශ ලක්‍ෂ 240 ක බහුපාර්ශ්වීය අතුරු අරමුදල පිහිටුවීමට1990 ජූනි මාසයේදී ලෝක ප්‍රජාව එකග විය.

තව ද, ලෝක බැංකුවේ, එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදලේ සහ එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහනේ ද සමායෝජකත්වයෙන් ඩොලර් බිලියන 1.5 ක මුදල් සැපයුමකින් යුත් අරමුදලක් වන "ගෝලීය පාරිසරික පහසුකම්" නමැති අරමුදල පිහිටුවීමට 1990 දී රාජ්‍යයන් විසින් එකග වන ලදී. මෙකී අරමුදලේ ප්‍රමුඛත්ව අංශ හතර වනුයේ ගෝලීය උණුසුම අඩු කිරීම, ජාත්‍යන්තර මුහුදු ආරක්‍ෂා කිරීම, ජෛව විවිධත්වය රැක ගැනීම සහ ඕසෝන් ස්තරය තව දුරටත් හානි වීම වලක්වා ගැනීම යන මේවා ය.

අපගේ ග්‍රහලෝකය සතු ව රැකුණු ජෛව සම්පත් උරුමයට අයත් බෙහෙවින් අප්‍රකට, එළිදරව් නො වූ ශාක, සතුන් සහ ජාන සම්පත් ආරක්‍ෂා කිරීම සඳහා නව නීති ගෙන ඒමේ දැඩි අවශ්‍යතාව පිළිගනිමින්, ජෛව සම්පත් සංරක්‍ෂණය සහ ප්‍රවර්තනීය ලෙස සංවර්ධනය කිරීම පිළිබඳ ගෝලීය ප්‍රඥප්තියක් ඇති කර ගැනීම පිණිස එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන විසින් ජාත්‍යන්තර සාකච්ඡාව සම්බන්ධීකරණය කරගෙන යනු ලැබේ. සාකච්ඡාවට සහභාගි වන රටවල් හමුවේ ඇති ප්‍රධාන ප්‍රශ්න අතරින් සමහරක් නම් තාක්‍ෂණ පැවරුම්, තමන්ගේ ම සම්පත් ප්‍රයෝජනයට ගැනීමට ඒ ඒ රටවලට ඇති පරම අයිතියත්. ගෝලීය පොදු වස්තූන් ආරක්‍ෂා කර ගැනීමේ අවශ්‍යතාවත් අතර පවත්නා සමතුලිතතාව සහ අතිරේක මූල්‍ය සම්පත් යන මේවා ය. කාලගුණ විපර්යාස පිළිබඳව සිදුකැරෙන සාකච්ඡාවන් හමුවේ ද මීට සමාන ප්‍රශ්න ඇත.

මීට අමතරව වඩා යහපත් පාරිසරික කළමනාකරණයක් වර්ධනය කර ගැනීම සඳහා උපකාරී වන- උපදේශමාලා, චර්යා නියමයන්, ප්‍රතිපත්ති සහ අභිප්‍රායයන්ගෙන් යුත් - වර්ධනය වන ජාත්‍යන්තර "ලිහිල් නීති මාලාවක් ඇති කිරීමෙහි ලා එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන උපකාරී වී ඇත. උපද්‍රවකාරී අපද්‍රව්‍ය කළමනාකරණය, කලින් කැමැත්ත දැන්වීම පිළිබඳ කාර්ය පටිපාටිය වැනි දියුණු තොරතුරු හුවමාරු විධිවිධාන ඇතුලත් වූ උපද්‍රවකාරී අපද්‍රව්‍ය වෙළඳාම පිළිබඳ උපමානයන්, ස්වභාවධර්මය පිළිබඳ 1982 ලෝක සම්මුතිය, පාරිසරික බලපෑම් තක්සේරුව පිළිබඳ ප්‍රතිපත්ති ගොඩබිම් මූලාශ්‍රයන්ගෙන් මුහුදු අපවිත්‍ර වීම සමුද්‍රාශ්‍රිත කැණීම් සහ විදීම කාලගුණික විපර්යාසයන මේවා ඊට ඇතුලත් වේ.

**කාන්තාරිකරණය**

ලෝක ප්‍රජාව භයානක ලෙස අමතක කර දමනු ලැබ ඇති අත්‍යවශ්‍ය පාරිසරික ගැටළුවක් නම් භූමි හායනයයි බිම් පාළු කිරීමත් භූමි හායනයත් මගින් දළ වශයෙන් ටොන් දශ ලක්‍ෂ 25 ක පමණ සාරවත් මතුපිට පස් ප්‍රමාණයක් සෑම වර්ෂයකදී ම අහිමි වී යයි. මේ හේතුවෙන් ලෝක ආහාරමය ආරක්‍ෂාව

වඩාත් දුෂ්කරතාවට පත් වන අතර දශලක්ෂ ගණන් ජනතාවට -අප්‍රිකාවේ බහු තර ජනතාවට- ආහාර හිඟයකට සහ සාගතයකට මුහුණ දීමට සිදු වේ.

කාන්තාරීකරණය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුව 1977 දී කාන්තාරීකරණය පිළිබඳ කාර්ය සැලැස්මක් යොදා ගත් අතර, එය ක්‍රියාත්මක කිරීමේ වගකීම එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන වෙත පැවරිණ. ඒ අනුව, එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන විසින් එය ක්‍රියාත්මක කරනු ලැබිය යුත්තේ කලාපීය කාන්තාරීකරණ කාර්ය පද්ධතියක් පිහිටුවා ගැනීම, විස්තරාත්මක කාර්ය සැලසුම් සම්පාදනය සඳහා ආණ්ඩුවලට සහාය වීම, ජැමෙයිකාව, සැම්බියාව සහ කොලොම්බියාව යන රටවල ගංගා දියබෙත්ම ආරක්ෂා කිරීම සඳහා නියාමක ව්‍යාපෘති ඇති කිරීම, අප්‍රිකා, අන්දීස් සහ හින්දුකුස් යන පහසුවෙන් බිඳ වැටෙන කඳු පරිසර පද්ධති තුළ ගොවිතැන් ක්‍රම වැඩිදියුණු කිරීම, නිවර්තන කලාපීය පස් ගැන අධ්‍යයනය කිරීම, විද්‍යාඥයන් පුහුණු කිරීම, කාර්මික දත්ත පදනම් ඇති කිරීම සහ ජනතාව දැනුවත් කිරීමේ හා ප්‍රවෘත්තිමය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ද තුළිනි.

ගෝලීය පාංශු හායනය තක්සේරු කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන ජාත්‍යන්තර පාංශු සන්දේශ තොරතුරු මධ්‍යස්ථානයත් ආහාර හා කෘෂිකාර්මික සංවිධානයත් යුනෙස්කෝව සහ වෙනත් සංවිධානත් සමග කටයුතු කරයි. කාන්තාරීකරණය සිතියම්ගත කිරීමේ ක්‍රමාවලීන් සංවර්ධනය කර ගැනීමට එය උදව් දී ඇති අතර කාන්තාරීකරණය පිළිබඳ තේමාවනුගත සිතියම් සහිත ගෝලීය සිතියම් පොතක් එය විසින් පිළියෙල කරගෙන යනු ලැබේ. සහරාවේ උතුරු කෙළවර දිගේ බඩවැටි වැවීමට ක්‍රියා කරන නැවත වන වගා කිරීමේ ව්‍යාපෘතියක් වන "උතුරු අප්‍රිකානු දේශාන්තර හරිත තීරය" සඳහා ලේකම් කාර්යාලයීය එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන විසින් කාන්තාරීකරණය පිළිබඳ තාක්ෂණික හා වෙනත් අධ්‍යයන ගණනාවක් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති අතර, 1992 පෙබරවාරි මාසයේදී කාන්තාරීකරණය පිළිබඳ තත්තවය සහ එහි කාර්ය සැලසුම් ක්‍රියාත්මක කිරීමටත් ඒවාට මුදල් යෙදවීමත් පිළිබඳ වාර්තාවක් එහි පාලන මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. ගැටළුව තිබියදී, අවශ්‍ය ක්‍රියාමාර්ගවලින් බොහෝ පසුපස ආණ්ඩු මන්දෝත්සාහී වූ අතර මෙකී හදිසි ප්‍රශ්නය ගැන සැලකිලිමත් වීම සඳහා ඔවුනට මූල්‍යමය බැඳීම් අවශ්‍ය වූ බැව් ද ඒ වාර්තාවෙන් අවධාරණය කෙරේ.

**පාරිසරික අධ්‍යාපනය**

වර්ෂ ගණනාවක් මුළුල්ලේ එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන, යම් යම් අවස්ථාවලදී ප්‍රතිවිරුද්ධ වූ කණ්ඩායම් අතර පරතරය නැති කිරීමට උත්සුක වූ ජාත්‍යන්තර රැස්වීම් ගණනාවක් සංවිධානය කිරීමට ද උදව් වී ඇත. ප්‍රධාන උපාය මාර්ගයක් වනුයේ අධ්‍යාපනයයි. එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහනේ අය වැයෙන් පහෙන් එක් පංගුවක් පමණ වැය කෙරෙනුයේ අධ්‍යාපනයට සහ පුහුණුවටයි. වර්ෂ 1973 සිට සහ එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන සහාය ඇතිව, පවත්වන ලද එහි මිහිතල අධීක්ෂණ වැඩසටහන හා සම්බන්ධිත ජාන සම්පත් සංරක්ෂණ ක්‍රම, වෙරළ කළමනාකරණය, පළිබෝධ සහ කෘමි දෛශික පාලනය, ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණය, වනවගා කළමනාකරණය සහ පරිගණක පුහුණු සම්මන්ත්‍රණ ඇතුළු බොහෝ විට අතිශයින් විශේෂිත වූ වැඩමුළුවලට සහ පුහුණු සම්මන්ත්‍රණවලට 30,000 කට අධික තාක්ෂණවේදීන්, ශිෂ්‍යකයන් සහ තීරණ ගන්නා පුද්ගලයන් ද සහභාගී වී ඇත.

මේවායේ සහ එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහනට අයත් වෙනත් වැඩ සටහන්වල ද මුඛ්‍යාර්ය සරලය. පරිසරය රැක ගැනීම හැම දෙනෙකුටම සතු කාර්යයකි. අපගේ ග්‍රහ ලෝකය ආරක්ෂා කිරීමත් අප දරුවන්ගේ අනාගතය ආරක්ෂා කර ගැනීමත් රජයේ "විශේෂඥයන්" වෙත පැවරිය යුත්තකට වඩා බොහෝ වැදගත් වේ. ඇත්ත වශයෙන් ම, හරිත කාර්ය පත්‍රයේ නැගීමට තුඩු දී ඇත්තේ මහජනතාවගේ ප්‍රවේදිතාවත් ඔවුන්ගේ එදිනෙදා කටයුතුත් බැව් වාර්තාවන්ගෙන් තහවුරු වේ. පාරිසරික වශයෙන් යහපත් සහ ප්‍රවර්තනීය සංවර්ධනය ඇති කර ගත හැකි බව උදාහරණ තුළින් පෙන්වූ බොහෝ දෙනාගෙන් ඇතැමකුට ගෝලීය ප්‍රදාන 500 දී එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන විසින් සම්මාන පුදනු ලැබ ඇත.

මහජන ප්‍රවෘත්ති; පහළ සිට ඉහළට මතුවෙන ප්‍රතිපත්ති ඉතා ම සාර්ථක ඒවා බවට අත්දැකීමෙන් පෙනී ගොස් ඇත. ස්වභාව ධර්මය සඳහා වූ ලෝකව්‍යාප්ත අරමුදල, ලන්ඩන් නගරය මුල් කොට ගෙන ඇති පරිසරය සඳහා වූ රූපවාහිනී භාරය (TVE), නිව්යෝර්ක් සත්ව විද්‍යා සංගමය සහ නිව්යෝර්ක් විශ්ව විද්‍යාලයද සමග සහයෝගිතාවෙන් යුතුව 1982 දී පිහිටුවනු ලැබූ එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන අයත් විස්තෘත වැඩ සටහනේ (Outreach Programme) මූලික පරමාතීය වනුයේ

සබඳතා ගොඩ නගා ගැනීමට උපකාරී වීමත් තොරතුරු හුවමාරු ජාලයක් ඇති කිරීමත් එ මෙන් ම, තොරතුරු රැස් කොට තබා ගැනීමේ මධ්‍යස්ථාන ඇති කිරීමත් ය. වෂී ගණනාවක් තිස්සේ ම –ඉතා ම මෑතකදී "රාජ්‍ය නොවන සංවිධානවල වට මේස" සාකච්ඡා මාලාවක් මගින්– එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන විසින් රාජ්‍ය නොවන සංවිධානද බාලදක්ෂයන් සහ බාලදක්ෂිකාවන් ද රතු කුරුස සහ රතු චන්ද්‍රවංක සංගම් සහ වෙනත් සංවිධාන ද සමග සබඳතා ගොඩ නගා ගනු ලැබ ඇත.

පාරිසරික කාර්ය සටහන ඉදිරියට ගෙන යාම සඳහා මහජන තොරතුරු –විශේෂයෙන්ම පුවත්පත් නිවේදන, විශේෂ ප්‍රවෘත්ති ප්‍රචාර, විශේෂ වැඩසටහන්, ප්‍රකාශන, චිත්‍රපට, රූපවාහිනී සහ ප්‍රදර්ශන මගින්– ඉතා අවශ්‍යය. එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන විසින් පාරිසරික ප්‍රශ්න සම්බන්ධයෙන් මහජනයාගේ සැලකිල්ල යොමු කරවනු ලැබේ. එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහනට අයත් ප්‍රකාශන සහ ශ්‍රව්‍ය-දෘශ්‍යයන් ඕසෝන් ස්තරය පිළිබඳ විද්‍යාත්මක හා බෙහෙවින් විශේෂිත වූ කටයුතු ද බලශක්ති කාර්යක්ෂමතාව සහ උපද්‍රවකාරී අපද්‍රව්‍යවල ද සිට වසරකට හය වරක් ඉදිරිපත් කෙරෙන කාන්තාරීකරණය පිළිබඳ සර්පණ දර්ශනයක්ද, කර්මාන්ත හා පරිසර ප්‍රකාශනය, රජයේ යෝජනා පිළිබඳ තාවකාලික වාර්තා, ගෝ.පා.ක.සේ. පාරිසරික පුස්තකාල මාලා සහ අපගේ ග්‍රහ ලෝකය ද යන කරුණු දක්වා පැතිර යයි. මෙකී ප්‍රකාශනවලින්, චිත්‍රපටවලින් සහ අනෙක් උපකරණවලින් බොහොමයක් මෙකී පත්‍රිකාවේ ලැයිස්තු ගත කොට ඇති එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන් කාර්යාලයකට ලිවීමෙන් නොමිලේ ලබාගත හැකි ය.

අප්‍රිකානු, ආසියානු සහ ශාන්තිකර, යුරෝපා, උතුරු ඇමරිකානු, ලතින් ඇමරිකානු සහ කැරිබියානු ප්‍රදේශ උදෙසා පිහිටුවා ඇති එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහනට අයත් කලාපීය හා ආධාරක කාර්යාලවල බලතල, සබඳතා ගොඩනැගීම තුළින් අවධාරණය වේ. බටහිර ආසියාවේ සම්බන්ධතා කාර්යාලය ද වොෂින්ටන් ඩී.සී. අරාබි ලීගයේ සම්බන්ධතා කාර්යාලය ද එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන විසින් මෙහෙයවනු ලැබේ.

දූෂණය අඩු කිරීමේ තාක්ෂණිකයන්ට අදාළ තොරතුරු සහිත කර්මාන්ත 1975 සිට ලබා දුන් එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහනට අයත් පැරිසියේ පිහිටි කර්මාන්ත හා පරිසර කාර්යාලය විසින් අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රමෝපාය, වඩා පිරිසිදු නිෂ්පාදන ක්‍රම, කළමනාකරණ පුහුණුව පාරිසරික හදිසි අවස්ථා සැලසුම් සම්පාදනය සහ වෙනත් අංශ ඊට සම්බන්ධ කරනු ලැබිණ. නව කාර්ය සටහනක් තැනීමට උදව් කිරීම; තීරණ ගන්නා තැනැත්තන්ට සහ විශේෂඥයන්ට ඔවුනොවුන්ගෙන් කරුණු ඉගෙන ගැනීමට ඉඩ සැලසෙන ලෙසත් ජාත්‍යන්තර පාරිසරික කාර්ය සටහන ඒකමතිකත්වයෙන් යුතුව ඉදිරියට ගෙනයාමට හැකි වනු පිණිසත්, රැස්වීම්වල සහ ජාත්‍යන්තර වේදිකාවල සහ සමුළුවල වැදගත් කම එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන අවබෝධ කොට ගෙන ඇත. සැබෑ වෙනසක් ඇති කළ රැස්වීම් ගණනාවක් ම සංවිධානය කිරීමට එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන උපකාරී වී ඇත. එක් නිදසුනක් නම් –එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහනේ මූලිකත්වයෙන් සංවිධානය කරනු ලැබූ පාරිසරික කළමනාකරණය පිළිබඳ 1984 ලෝක කර්මාන්ත සමුළුවත් ජාත්‍යන්තර වෙළඳ මණ්ඩලය සහ එහි පසු විපරම් වශයෙන් 1991 සාර්ථක ලෙස පැවැත්වුණු **WICEM II** සමුළුවත් මගින් පාරිසරික වශයෙන් හානිකර නො වන කාර්මික ප්‍රතිපත්ති ප්‍රවර්ධනය උදෙසා සංවර්ධිත සහ සංවර්ධනය වන රටවල කර්මාන්ත අධිපතීන් ඒකරාශී කෙරිණ. ඇත්ත වශයෙන් ම, පාරිසරික වැඩසටහන දඬුවම් ලබා දෙනු පිණිස ඇති කරන ලද වැඩපිළිවෙලක් නොවේ ය යන පිළිගැනීම පෞද්ගලික අංශය තුළ වර්ධනය වෙමින් පවතී. ඒ වෙනුවට, පාරිසරික කළමනාකරණය යනු හොඳ කළමනාකරණය ම බවත් නිෂ්පාදනය වඩා පිරිසිදු ලෙස සිදු කිරීමෙනුත්, අපද්‍රව්‍ය අඩු කිරීමේ ඒකාබද්ධ ක්‍රියාමාගී අනුගමනය කිරීමෙනුත් නිෂ්පාදනයේමුල් අවස්ථාවේදී අපද්‍රව්‍ය අඩු කර ගැනීම පාරිසරික වශයෙන් මෙන් ම ආර්ථික වශයෙන් ද කාර්යක්ෂම ක්‍රියාමාගීයක් ය යන කාරණය තරගකාරී සමාගම්වලට අවබෝධ වෙමින් පවතී.

ලෝක සංරක්ෂණ උපායමාගී දෙකක් සංවිධානය කිරීමට ද එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන උපකාරී වී ඇත."අපගේ පොදු අනාගතය" යන්නෙහි සිය සොයාගැනීම් ඉදිරිපත් කළ පාරිසරික හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රචාරාත්මක ලෝක කොමිෂන් සභාව; දේශගුණ විපර්යාසය පිළිබඳ රාජ්‍යාන්තර අනුමණ්ඩලය සහ 1991 අග භාගයේදී, ප්‍රවතීනීය සංවර්ධනය මුදුන් පමුණුවා ගත හැකි අරමුණකැයි යන්නට හොඳ ම නිදසුන් වශයෙන් සංවර්ධන සහ සංවර්ධනය වන රටවලට අයත් ප්‍රකට කාන්තාවන් 500 දෙනෙකුගේ ප්‍රාථමික, සහභාගී සහ නැවත නැවතත් සිදු කළ හැකි යන තුන් ආකාරයේ පාරිසරික කාර්යසාධන සාකච්ඡාවට භාජනය වූ ගෝලීය කාන්තා සමුළුව ද ඒ අතර වේ.

## මිහිතල අධීක්ෂණය

එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහනට අයත් පළමු ප්‍රමුඛතාව වනුයේ බෙහෙවින් ම යාවත්කාල වූ ද නිවැරදි වූ ද කාලීන වූ ද විද්‍යාත්මක දත්ත ගැන සහතික වීමයි. දෙවැනි කරුණ වනුයේ පාරිසරික කළමනාකරණයට අදාළ වූ නතුදත් සහ විමර්ශනශීලී තේරීම් කළ හැකි වනු වස් එකී තොරතුරු තීරණ ගන්නා පුද්ගලයන් අතට පත් කිරීමයි. පාරිසරික ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන කටයුතු කර ඇති අවුරුදු විස්සක කාලය තුළදී ඒ සඳහා කෙටි ක්‍රමයක් හෝ තාක්ෂණික ස්ථාපන හෝ ප්‍රතිපත්තිමය නිවාරණ ක්‍රමයක් හෝ නැති බව අප උගෙන ඇත. ප්‍රතිපත්තියේ "නිවැරදි බව" ප්‍රධාන කොට ම රඳා පවත්නේ විද්‍යාවේ "නිවැරදි බව" මතය. ඇතැම් කඳවුරු කෙරෙන් ලෝක විනාශයක පෙරනිමිති ගැන ප්‍රකාශන නිකුත් වෙද්දී තවත් ඇතැම් දෙනා සාමාන්‍ය පරිදි ව්‍යාපාරික අවශ්‍යතා සොයා යද්දී පාරිසරික ප්‍රශ්න නව තවත් දේශපාලන ස්වරූපයකට නැඹුරු වන විට එ.ජා.පා.වැ. විසින් සිය මෙහෙයුම් වාස්තවිකත්වය, අපක්ෂපාතී භාවය සහ නිවැරදි බව මැදි කොට ගෙන ගොඩනංවන ලදී. මිහිතල අධීක්ෂණ වැඩසටහනේ මූලික අරමුණ එයයි.

එ.ජා.පා. වැඩසටහනට අයත් ප්‍රයත්නයන්ගේ කොඳු නාරටිය වනුයේ උපාංග හතරකින් සමන්විත මිහිතල අධීක්ෂණ වැඩසටහනයි. ඒවා නම්, රටවල් 140 ක පැතිර ඇති ගෝලීය පරිසර අධීක්ෂණ ක්‍රමය (GEMS), පාරිසරික දත්ත ඉදිරිපත් කිරීම සඳහා භූගෝල විද්‍යාත්මක තොරතුරු ක්‍රමය සහ චන්ද්‍රිකා ප්‍රතිරූප සැකසුම් තාක්ෂණය ද යොදා ගන්නා ගෝලීය සම්පත් තොරතුරු දත්ත පදනම (GRID), එක් එක් වර්ෂයකදී පරිසරයට අදාළ ප්‍රශ්න 20,000 කට පිළිතුරු සපයන "ඉන්ෆොටෙරා" (INFOTERRA) සහ විභව්‍ය විෂ රසායනික පිළිබඳ ජාත්‍යන්තර ලේඛණය (IRPTC) යන මේවාය.

## ගෝලීය පරිසර අධීක්ෂණ ක්‍රමය (GEMS)

වර්ෂ 1975 සිට ගෝ.ප.අ. ක්‍රමය පවත්නා පාරිසරික අධීක්ෂණ ක්‍රම සම්බන්ධ කිරීමටත් තොරතුරු පිළිබඳ පරතර පියවීම සඳහා නව ජාල ඇති කිරීම උත්ප්‍රේරණය කිරීමටත් උපකාරී වී ඇත. ප රිසරය, බෙහෙවින් සංකීර්ණ සහ අන්තර් ක්‍රියාකාරී පද්ධතියක් වේ; සැකසුම් සිය ගණනක් ඈත කඳුකර දිය බෙත්ම බාදනය වීම හේතුකොට ගෙන පහළින් පිහිටි ඩෙල්ටාවන් කෙරෙහි ඍජු සහ භයානක බලපෑම් ඇති විය හැකි අතර ඒ කරණකොට ගෙන ජලගැල්ම හෝ කෘෂිකාර්මික නිෂ්පාදිතාවන්ගේ වෙනස්වීම් ද සිදු විය හැකිය. මෙකී සංකීර්ණ සම්බන්ධතාවන් අවබෝධ කරගැනීම සඳහා විද්‍යා උපකරණ, පුහුණු වූ තැනැත්තන් සහ දත්ත නිරතුරුව හුවමාරු කිරීම සහ යාවත්කාල කිරීමද සහිතව නිවැරදිතාව සහ සමීක්ෂණය ද අවශ්‍ය වේ. ගෝ.ප.අ. ක්‍රමය, ගෝලීය වශයෙන් වැදගත් වන ප්‍රධාන ක්ෂේත්‍ර 5 ක් කෙරෙහි අවධානය යොමු කරයි. ඒවා නම් දේශගුණය, දේශසීමා ඉක්මවා කෙරෙන දූෂණය, ප්‍රතිසම්පාදනීය ස්වාභාවික භෞමික සම්පත්, සාගර සහ පරිසර දූෂණය යන මේවාය.

නිදසුනක් වශයෙන් සාගර අධීක්ෂණය එ.ජා.පා. වැඩසටහනට අයත් සාගර සහ වෙරළාශ්‍රිත ප්‍රදේශ වැඩසටහන මගින් ප්‍රතිෂ්ඨාපිත ජාත්‍යන්තර ජාලයන් හරහා ක්‍රියාත්මක වේ. යුරෝපයේ දේශාන්තර වායු දූෂණය යුරෝපීය පාරිසරික අධීක්ෂණ සහ ඇගයුම් වැඩසටහන මගින් අධීක්ෂණය කෙරේ. ලෝකයේ කාලගුණ අධීක්ෂණය කිරීමෙහිලා සම්බන්ධ වන ප්‍රධාන කාර්යජාල වලින් දෙකක් (එ.ජා.පා. වැඩසටහන සහ යුනෙස්කෝව ද තාක්ෂණය පිළිබඳ ස්විට්සර්ලන්ත ෆෙඩරල් ආයතනය ද මගින් මෙහෙයවනු ලබන) ඒකාබද්ධව ක්‍රියාත්මක වන ලෝක ග්ලැසියර අධීක්ෂණ සේවය සහ රටවල් 95 ක් ඇතුලත් වන එ.ජා.පා.වැ. - ලෝක කාලගුණ විද්‍යා සංවිධානය පසුබිම් වායුදූෂණ අධීක්ෂණ කාර්යජාලය ද වේ.

එ.ජා.පා. වැඩසටහනට අද ගෝලීය ප්‍රධාන අධීක්ෂණ ජාල 25 ක් අයත් වන අතර ඒ එකිනෙකක් සඳහා එක්සත් දත්ත පදනමක් ඇත. මීට රටවල් 142 ක කටයුතු ඇතුලත් වේ. පොදු තත්ත්ව සහතික කාර්ය පටිපාටි පිළිගැනීමෙහි ලා විද්‍යාඥයන් සහ තාක්ෂණ වේදීන් 30,000 කට අධික සංඛ්‍යාවක් සම්බන්ධ වී ඇති අතර උචිත අවස්ථාවන්හි දී එක් අධීක්ෂණ උපකරණ කට්ටලයකින් ලබා ගන්නා දත්ත විවිධ මානයන් සහිතව අනෙක්වාට අදාල කරගත හැකි වන පරිදි ඔවුහු දනට ක්‍රියාත්මක වන ක්‍රමාංකන පිරිස්සුම්වලට සහභාගී වෙති.

පාරිසරික අධීක්ෂණ දත්ත ක්‍රමාංකනය කිරීමේ ප්‍රධාන අංගයක් වශයෙන් පිහිටුවන ලද අධීක්ෂණ සහ තක්සේරු පර්යේෂණ මධ්‍යස්ථානය විසින්, දනට ලබාගතහැකි අතිශයින්ම යාවත් කල ගෝලීය පාරිසරික සංඛ්‍යාලේඛණ ඇති ලියවිල්ල වන ද්විවාර්ෂික එ.ජා.පා වැඩසටහන පාරිසරික දත්ත වාර්තා ඉදිරිපත් කරනු ලැබේ. තවද, ගෝලීය පරිසර අධීක්ෂණ ක්‍රමය අනතුරට ලක් වූ විශේෂයන් සහ වාසභූමි පිළිබඳ දත්ත පදනම් ඉදිරිපත්කිරීම උදෙසා, එක්සත් ජනපදයේ කේම්බ්‍රිජ්හි පිහිටි ලෝක

සංරක්ෂණ අධීක්ෂණ මධ්‍යස්ථානය හා සමග ද ක්‍රියා කරන අතර රතුදත්ත පොත් (Red Data Books) වාරිකව ප්‍රකාශයට පත් කරයි.

නාගරික වායු තත්ත්වය, ජල තත්ත්වය, ආහාර අපවිත්‍ර වීම, හා පරිසරය සහ සෞඛ්‍යය යන මේවාට බලපාන දූෂක ද්‍රව්‍ය සම්බන්ධයෙන් ක්‍රියාකරන පාරිසරික තත්ත්ව කායඝ්ජාලය ගෝ.ප.අ. ක්‍රමය විසින් සමායෝජිත වන අතර ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් පවත්වාගෙන යනුද ලැබේ. සෙසු ගෝ.ප.අ.ක්‍ර. කායඝ් ජාල විසින් ගුප්ත සහ අර්ධ ගුප්ත භූමිවල වෘක්ෂලතා සහ සත්ත්ව ගහනය ද පස් වර්ග ද පාංශු හායනය ද නිවර්තන වන සම්පත් ද මැන බලනු ලැබේ. ජාතික පදනමක් මත කෙරෙන කටයුතු වලට දේශගුණය, පස, ශාක, සත්ත්ව අධ්‍යයනයන් ද පරිසරය කෙරෙහි මිනිසාගේ බලපෑම් ද ඇතුලත් වේ.

**ගෝලීය සම්පත් තොරතුරු දත්ත පදනම (GRID)**

පහසුවෙන් තේරුම් ගත හැකි සිතියම් සහ මුද්‍රණ මගින් සැලසුම් සම්පාදකයන්ට සහ තීරණ ගන්නා අයට ලබා ගැනීමට සැලැස්වීම කලින් සංකීර්ණ පාරිසරික දත්ත ඉදිරිපත් කිරීම සහ විශ්ලේෂණය කිරීම සඳහා භූගෝල විද්‍යාත්මක තොරතුරු ක්‍රම (GIS) සහ චන්ද්‍රිකා ප්‍රතිරූප සැකසුම් තාක්‍ෂණය ප්‍රයෝජනයට යොදා ගන්නා වැඩසටහනක් වන ගෝලීය සම්පත් තොරතුරු දත්ත පදනම්, 1985 දී එ.ජා.පා. වැඩසටහන විසින් දියත් කරන ලදී.

ගෝ.ස.තො.ද. සම්බන්ධීකරණ ඒකකය නයිරෝබි නුවර පිහිටි එ.ජා.පා. වැඩසටහන් මූලස්ථානයෙහි ඇති අතර ජිනීවා, බැංකොක්, ඇරෙන්ඩාල් සහ සියුක්ස්ෆෝල්ස්, ඇ.එ.ජ. යන ස්ථානයන්හි ප්‍රාදේශීය කාර්යාල ඇත.

අලි ඇතුන්ගේ සංඛ්‍යාව පිළිබඳව ලොව බෙහෙවින්ම නිවැරදි වූත් විස්තරාත්මක වූත් දත්ත බැංකුව සම්පාදනය කිරීම සඳහා පරිගණක තාක්‍ෂණය යොදගැනීම් වස් ලෝ.ව.අ. සහ එල්සා වනසත්ත්ව අභියාචනය යන සංවිධාන සමග සහයෝගයෙන් කටයුතු කිරීම මෙකී වැඩසටහනට අයත් ක්‍රියාමාර්ග පිළිබඳ එක් නිදසුනක් වේ. ගෝ.ස.තො. දත්ත පදනමට අයත් නයිරෝබි කාර්යාලයේ වැඩකරන අලි-ඇතුන් විශේෂඥයන් විසින් ගුවන් සහ භූමි සමීක්ෂණ මගින් එකතු කර ගන්නා ලද විවිධ දත්ත ලබා ගන්නා ලද අතර වෘක්ෂලතා, මිනිස් ජනගහණ ඝනත්වය කෙරෙහි එකී තොරතුරු අදාළ වන්නේ කෙසේද? යනු සොයා බැලූ අතර අලි ඇතුන් සංරක්ෂණය කිරීම හා සම්බන්ධ රටවලටත් ප්‍රදායක රටවලටත් වනසත්ව සංරක්ෂණය වැඩි දියුණු කර ගැනීම සඳහා උපකාරී වීමට මෙකී තොරතුරු උපයෝගී කර ගත්හ.

ගෝ.ස.තො.ද. පදනම ලබා ගත් තොරතුරු මගින් වෙනත් නියෝජිත ආයතන සහ ආණ්ඩු ගණනාවකට පාරිසරික දත්ත සපයන ලදී. නැගෙනහිර වෙරළේ රෝග පිළිබඳ අවදානම් දක්වෙන සිතියම් ද සහිතව සත්ව රෝග පිළිබඳ ජාත්‍යන්තර පර්යේෂණ රසායනාගාරය ද අන්කිසි සංවර්ධනය වන රටක දක්නට නොලැබෙන අතිශයින්ම විස්තරාත්මක දත්ත පදනමකින් යුත් උගන්ඩාවේ පරිසර සංරක්ෂණ අමාත්‍යාංශය වියැංමායී පළාතෙහි වනගහණ ප්‍රවණතා සනිකොයා බොක්කේ මසුන් ඇති කිරීම යන මේවා ඊට ඇතුළත් වේ.

**සම්භාව්‍ය විෂ රසායනික පිළිබඳ ජාත්‍යන්තර ලේඛනය (I.R.P.T.C.)**

ජිනීවාහි පිහිටි සම්භාව්‍ය විෂ රසායනික පිළිබඳ ජාත්‍යන්තර ලේඛනය පිළිබඳ මුඛ්‍ය පරමාර්ථය වනුයේ අද භාවිතයේ ඇති 80,000 ක් පමණ වන රසායනික ද්‍රව්‍යවලට සහ ඒ තොරතුරු අවශ්‍යකරන මිනිසුන්ටද අදාළ වේගයෙන් වෙනස් වන තොරතුරු අතර පවත්නා පරතරය අඩු කිරීමට උපකාරී වීමයි. බෝපාල් ඛේදවාචකය සහ දිනපතා ම රසායනික ද්‍රව්‍ය තුනක් පමණ වෙළඳ පොළට අවතෙන් එකතු වීම ද සැලකිල්ලට ගත් කළ ඒවායින් සිදුවන අනතුර ඒවා නිසි ලෙස පරිහරණය කරන ආකාරය අපහරණය කිරීමේ උපමානයන් නිශ්චිත රසායන ද්‍රව්‍ය ජාතික වශයෙන් සීමා කිරීම සහ වෙනත් දත්තවලට අදාළ තොරතුරු ආණ්ඩුවලට ද කර්මාන්තවලටද රාජ්‍ය නොවන සංවිධානවලට ද අදාළ වෙනත් පුද්ගලයන්ට ද ලබා ගැනීමට හැකිකම තිබීම අත්‍යවශ්‍ය වේ. සෑම වර්ෂයකම, ඉල්ලීම් සිය ගණනාවකට සම්.වි.ර.ජා.ලේ. පිළිතුරු දෙයි. පහළ මට්ටමේ කාර්මික රසායන ද්‍රව්‍යවල බලපෑමට ලක්වූ ළමයින්ගේ උගුර වණවීම බඳු වේදනාකාරී රෝග ලක්‍ෂණවල සිට සම්බන්ධීකරණ කාරකයක් ලෙස රසදිය පාවිච්චි කරන රන්ආකර කරුවන්ට ඇතිවන අවදානම් තත්ත්වයන් දක්වා මේවා වෙනස් වේ. නම අළුත් ම නීති සහ පර්යේෂණ පිළිබඳ පුවත් සම්.වි.ර.ජා.ලේ ට දන්වා යැවීම සඳහා රටවල් 110 ට අධික සංඛ්‍යාවකට දූත් ජාතික වාර්තා කරුවෝ සිටිති. මීට අමතර වශයෙන් එය තමාගේ ම දත්ත බැංකුවක් පිහිටුවමින් සිටින අතර ඉතා බහුල වශයෙන් පොදුවේ පාවිච්චි කරනු ලබන රසායන ද්‍රව්‍යවල සෞඛ්‍යමය සහ පාරිසරික බලපෑම් පිළිබඳ සවිස්තර තොරතුරු ඊට ඇතුළත්වේ. තවද, අත්හදා බැලීම්වලට ලක්වන රසායන ද්‍රව්‍ය පිළිබඳ අපද්‍රව්‍ය

කළමනාකරණය සහ අපහරණය පිළිබඳ විශේෂ ලිපි ගොනු ද ඒ අතර වේ.

තව ද සංවර්ධනය වන රටවල උපද්‍රවකාරී රසායන ද්‍රව්‍ය නීති විරෝධී ලෙස ඉවතට දැමීම නතර කිරීම පිළිබඳ සටනේදී සම්.වි.ර.ජා.ලේ. වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි. වර්ෂ 1989 දී එ.ජා.පා. වැඩසටහනේ පාලන මණ්ඩලය විසින් ජාත්‍යන්තර වෙළඳාමේදී රසායන ද්‍රව්‍ය පිළිබඳ තොරතුරු හුවමාරු කිරීම සඳහා ලන්ඩන් "ගිල්ඩ් ලයින්ස්" සඳහා සංශෝධනයක් සම්මත කර ගන්නා ලදී. කලින් දැනුම් දෙන නිවේදනය සහ කලින් දැනුම් දෙන කැමැත්ත පිළිබඳ කාර්ය පටිපාටි අනුගමනය කිරීම රටවලට නියම කෙරෙන ප්‍රගමණශීලී විධිවිධාන ඉහතකී සංශෝධනවලට ඇතුළත් වේ. තමාගේම ජාතික ලේඛන පිහිටුවා ගැනීමට සම්.වි.ර.ජා.ලේ. සංවර්ධනය වන රටවල් 10 කට උදව් වී ඇති අතර කලාපීය තොරතුරු හුවමාරු මූලික සැකැස්මක් සංවර්ධනය කැරගැනීමෙහි ලා අන්‍යෝන්‍ය ආර්ථික ආධාර මණ්ඩලයට දැනට සහාය දෙයි. අතිශයින් බහුල ලෙස භාවිතයට ගනු ලබන රසායන ද්‍රව්‍ය පිළිබඳ දත්ත රැස්කිරීම සහ තක්සේරු කිරීම පිළිබඳ සිය වැඩ සටහන්වලදී සම්.වි.ර.ජා.ලේ. OECD ආයතනය සහ යුරෝපා ප්‍රජාව සමග ද සමීප වශයෙන් කටයුතු කරයි.

**"ඉන්ෆොටෙරා"**

පරිසරයට අදාළ ව රැස්කරන ලද දත්ත සංග්‍රහ කිරීමෙහි ලා කෙතෙක් දුර කටයුතු කර තිබේදැයි පූර්වෝක්ත ඇතැම් වැඩසටහන් තුළින් අවධාරණය කෙරේ. ප්‍රශ්නය වී ඇත්තේ තොරතුරු හිඟ කම ම නො ව නිවැරදි තොරතුරු අල්ලා ගැනීමට මිනිසුන්ට නො හැකි වීමයි. ස්ටොක්හෝම් සමුළුවට අනතුරුව ම, "ඉන්ෆොටෙරා" පිහිටුවනු ලැබුවේ ප්‍රවෘත්ති සුවිචි පුවරුවක් ලෙස ක්‍රියා කිරීමට ය. පසු ගිය වර්ෂයේදී එය, 20,000 කට අධික පාරිසරික ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු දුන් අතර 140 ක් පමණ වූ රටවල් සමග තොරතුරු රැස් කළේ ය. එසේ ම, පරිසර විශේෂඥයන් පිළිබඳ ජාත්‍යන්තර නාමාවලිය යාවත්කාල කළේ ය.

මෙකී භයංකර කර්තව්‍යය සමායෝජනය කිරීමෙහි ලා "ඉන්ෆොටෙරා" සංවිධානයට 600 කට අධික වාණිජ දත්ත බැංකුවල සේවය ලබා ගත හැකි වන අතර ක්ෂේත්‍ර විශේෂඥයන් පිළිබඳ අද්‍යතන තොරතුරු ලබා දීම සඳහා එය 6500 ක පමණ ආයතන සංඛ්‍යාවක් සමග කටයුතු කරයි.

**මිහිතල ව්‍යාපෘතිය**

එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහනේ (එ.ජා.පා.වැ.) යෞවන සුහදතා තානාපති තැන්පත් රොබට් ස්වෝන් විසින් මෙහෙයවනු ලබන මිහිතල ව්‍යාපෘතිය, එ.ජා.පා.වැ. සමග සම්බන්ධතාවෙන් යුතුව සංවර්ධනය කරනු ලැබ ඇත්තේ පෘථිවි පරිසරය කෙරෙහි බලපාන වැදගත් ප්‍රශ්න පිළිබඳ ව තරුණ ජනතාව තුළ අවබෝධයක් ඇති කිරී ඔවුන් ඒ ගැන උනන්දු කරවීමත් ඔවුන්ට ඒ පිළිබඳ අධ්‍යයනයක් ලබා දීමත් සඳහා ය.

රොබට් ස්වෝන් වනාහි තරුණ ජනතාව තුළ මහත් උද්‍යෝගයක් ජනිත කරවන පුද්ගලයෙක් වේ. උත්තරධ්‍රැවයට මෙන්ම දක්ෂිණ ධ්‍රැවයට ද පයින් ගමන් කළ මොහු, පරිසරයට කරන ලද සේවාවන් වෙනුවෙන් එ.ජා.පා. වැඩසටහනේ ගෝලීය ප්‍රදානයන් 500 න් එක් ප්‍රදානයක් දිනාගත් තැනැත්තෙක් ද වේ.

මේ වර්ෂයේ ජූනිමස 6 වැනි දින උත්සවාකාරයෙන් රියෝද ජැනෙයිරෝ නගරයේදී පැවැත්වෙන ලෝක පරිසර දිනයේදී භූගෝල විද්‍යාත්මක වශයෙන් ප්‍රධාන තැනක් උසුලන ප්‍රදේශවල පාරිසරික ප්‍රශ්න සම්බන්ධයෙන් ජාත්‍යන්තර අවධානය යොමු කර ගැනීම උදෙසා සැලසුම් කරන ලද චාරිකා මාලාවක් වන සිය ප්‍රථම ලෝක චාරිකාවේදී ඔහු හා සම්බන්ධ වන තරුණයන් 6 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් පරිසරය හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළු කාලය තුළදී රොබට් ස්වෝන් විසින් ඉදිරිපත් කරනු ලබනවා ඇත. මේ අවස්ථාවේදී එ.ජා.පා. වැඩසටහනේ ගෝලීය ප්‍රදාන 500 අතරින් ලෝක චාරිකා වැඩසටහනට සම්බන්ධවන තරුණයන්ගේ ප්‍රදාන පිළිබඳ විස්තර ප්‍රකාශයට පත්කරනු ලබනවා ඇත. ප්‍රථමස්ථානය ගන්නා තැනැත්තා දෙසැම්බර් මාසයේදී නයිරෝබි හි පැවැත්වෙන එ.ජා.ප. වැඩසටහන විසිවැනි සංවත්සර උත්සවයේදී නම් කරනු ලබනවා ඇත. ලෝක පාද චාරිකා වනාහි මිහිතල ව්‍යාපෘතිය විසින් ලොව පුරා පාසල් වල භාවිතය සඳහා සංවර්ධනය කරනු ලැබූ ප්‍රධාන අධ්‍යාපන වැටසටහනේ කේන්ද්‍රස්ථානය උසුලයි. මේ වර්ෂයේ මුල් භාගයේ දී වොෂිංටන් නුවර පළපුරුදු කම් ලත් විෂයමාලා ලේඛකයන් සහ ගුරුවරුන් සමග රැස්වූ පරිසර විද්‍යාඥයන් සහ පරිසර පද්ධති පිළිබඳ විශේෂඥයන් විසින් පරිසර පද්ධති 11 ක් ආවරණය කෙරෙන එසේම පාරිසරික ක්‍රියාකාරකම් කෙරෙහි ශිෂ්‍යයන් සම්බන්ධ කරවන පාඨමාලා සැලසුම් ද ඇතිකරන විනයාන්තර පාරිසරික විෂය මාලාවන් ඉදිරිපත් කරනු ලැබ ඇත. උතුරු ඇමරිකාව තුල මුලින් නොමිලේ බෙදා හරින ලද මෙකී විෂය මාලාව ලෝකයේ ඕනෑම තැනක දී ප්‍රයෝජනයට ගත හැකි වේ.